**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2015**

---------------------------------------------------------------------------------

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,147,293 ක ඌනතාවයක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ඌනතාවයට වඩා සියයට 111 ක වැඩිවීමකි. විශ්‍රාම වැටුප් ගෙවීම් වල වැඩිවීම හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් වෙනුවෙන් වෙන්කිරීම රු.2,784,156,361 ක් වීම එම ඌනතාවය වැඩිවීමට බලපා තිබුණි. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව අහිතකර මූල්‍ය ප්‍රතිඵලයක් ඇතිවීම තුළින් ශුද්ධ වත්කම් සෘණාත්මක තත්ත්වයකට පත් වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වල සෘණාත්මක අගය රු. 2,151,853,459 ක් විය. යෝජනා ක්‍රමයේ සමස්ථ ලැබීම් ඉක්මවා විශ්‍රාම වැටුප් ගෙවීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් උද්ගත වී ඇති අතර දිගින් දිගටම මෙවැනි තත්ත්වයක් පැවතුණහොත් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි එය අහිතකර ලෙස බලපානු ඇත.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 08**

2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට අඩුවෙන් කරන ලද රු. 654,801 ක ගෙවීම් සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී අතීතානුයෝගීව ගැලපීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී අරමුදලට ගලපා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 19**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව ආයු ගණක තක්සේරුව සිදුකර නොතිබුණි. එම නිසා, 2007 වර්ෂයේදී සක්‍රීය දායකයන් හා විශ්‍රාමලාභීන් සංඛ්‍යාව 54,248 ක් වුවද එය 2015 වර්ෂයේදී 32,740 ක් දක්වා එනම් සියයට 40 කින් අඩුවී තිබූ නමුත් එම කාලයට අදාළ ප්‍රතිපාදනය රු. 1,242,006,539 සිට රු. 2,784,156,361 දක්වා එනම් සියයට 124 කින් වැඩිවී තිබුණි.

(ii) තවද, ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා ආයු ගණක තක්සේරුව හා ගිණුම් තැබීම සිදුකර තිබුණද, නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යටතේ අනාගත වගකීම පැවරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති රු1,182,885 ක ශේෂය සේවාදායකයා විසින් ආයෝජනය කර නොතිබුණි.

**2.3 ගෙවිය යුතු ගිණුම්**

එකතුව රු.1,431,025 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු නිරවුල් කිරීමෙන් තොරව 1998 වර්ෂයේ සිට ගිණුම්වල අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

**2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනත** | |
| (i) 16 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව සාමාජික ගාස්තු ගෙවීම පැහැරහරින ලද සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 20 වගන්තිය | උපදේශක කමිටුව නිල බලයෙන් පත්වන සාමාජිකයන් 06 දෙනෙකු හා නම් කළ සාමාජිකයන් 06 දෙනෙකු ඇතුළත්ව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද 2015 වර්ෂය වෙනුවෙන් සාමාජිකයන් 07 දෙනෙකු පමණක් පත්කර තිබුණි. |
| **(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| 9 පරිච්ඡේදයේ 9.7 ඡේදය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව නිලධාරීන් 04 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.506,928 ක් වූ විශේෂ දීමනා ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතුවලින් රු.15,147,293 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,170,305 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.7,976,988 ක එනම් සියයට 111 ක මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් නිරීක්ෂණය විය. විශ්‍රාම වැටුප් ගෙවීම රු.5,550,959 කින් වැඩිවීම හා පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.1,500,000 කින් අඩුවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

ධීවරයින්ගේ මහලු වයසේ දී හෝ දුබලතාවයක දී ධීවරයන්ට සමාජ ආරක්ෂණය සැලසීම, ධීවරයකු මියගිය විට එම ධීවරයාගේ යැපෙන්නන්ට සහන සැලසීම, තම ජීවනෝපායෙහි දිගටම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරවීම, තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම, ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉටු කිරීම පිණිස ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ස්ථාපිත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) තම ජීවනෝපායෙහි දිගට ම නියැලීම සඳහා ධීවරයන් උනන්දු කරවීම, තරුණ අය ධීවර කර්මාන්තය වෙත යොමු කරවීම, ධීවරයන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සහ සකසුරුවම්කම වැඩි දියුණු කිරීම යන පරමාර්ථ ඉටු කිරීම සම්බන්ධයෙන් යෝජනා ක්‍රමයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) අයවැය ඇස්තමේන්තු අනුව සමාලෝචිත වර්ෂය තුළදී යෝජනා ක්‍රමයට නව දායකයින් 200 ක් බඳවා ගැනීමට ඇස්තමේන්තු කළ ද දායකයින් 94 දෙනෙක් පමණක් බඳවා ගෙන තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළදී දායකයින් 85 දෙනෙකු යෝජනා ක්‍රමයෙන් ඉවත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ දායකයින්ගෙන් රු. 3,292,500 ක දායක මුදල් ලබා ගැනීමට අපේක්ෂා කර තිබුණද, ලැබුණු තථ්‍ය දායක මුදල රු. 1,030,292 කි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයට මුළු දායකය රු.1,030,292 ක් වුවද සමාලෝචිත වර්ෂය සඳහා මුළු විශ්‍රාම වැටුප් ගෙවීම රු.47,418,578 ක් විය. එබැවින් ලැබුණු දායකය ඉක්මවා විශ්‍රාම වැටුප් ගෙවීම සියයට 4,502ක් වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ සිට අවස්ථා කීපයකදී ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා ලබාදී තිබූ ණය මුදලින් 2015 දෙසැම්බර් 31 දිනට රු.628,322,254 ක (ණය සහ පොලී ) ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබූ අතර මෙම ණය අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) පසුගිය වර්ෂ 05ට අදාලව යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය අවලංගු කිරීම්, මියයාම් සහ දුබලතා වැනි හේතු නිසා වාර්ෂිකව සාමාජික සංඛ්‍යාවේ සිදුවන වෙනස්වීම් පිළිබඳව විගණනයට තොරතුරු ඉදිරිපත් නොවුණු අතර, සාමාජික සංඛ්‍යාවේ වෙනස්වීම් සහ ඊට අදාල හේතු පිළිබඳව කළමනාකරණය විසින් විශ්ලේෂණය කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට සක්‍රිය දායකයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමේ දී සාමාජිකයින් 29,310 ක් සහ සාමාජිකයන් 27,827 ක් වශයෙන් එකිනෙකට වෙනස් සංඛ්‍යාවන් ඉදිරිපත් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 26 සිට සියයට 69 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | නොගෙවූ විශ්‍රාම වැටුප් | නොගෙවූ විශ්‍රාම වැටුප් කාලීනව නැවත ගෙන්වා නොගැනීම. |
| (ආ) | කළමනාකරණ තොරතුරු පද්ධතිය | පද්ධතිය යාවත්කාලීන නොකිරීම සහ කළමනාකරණයට අවශ්‍ය වාර්තා ලබා ගැනීමට නොහැකිවීම. |